**සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය - 2022**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

[

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 07 වගන්තිය අනුව මාස 03 කල්පිරීමේ කාලයකින් යුතු ස්ථාවර තැන්පතු මුදල් සහ මුදල් සමාන දෑ යටතේ ඇතුලත් කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අනෙකුත් මූල්‍ය වත්කම් වටිනාකම තුල ඇතුලත් රු.546,426,154 ස්ථාවර තැන්පතු ශේෂයෙහි රු.98,130,274 ක මාස 03 කල්පිරීමේ කාලයකින් යුතු ස්ථාවර තැන්පතු වටිනාකමක් ඇතුලත් කිරීම තුලින් මුදල් හා මුදල් සමාන දෑ එම වටිනාකමින් අවතක්සේරු වී තිබුණු අතර අනෙකුත් මූල්‍ය වත්කම් එම වටිනාකමින් අධිතක්සේරු වී තිබුණි. | ලංකා බැංකුව පැලවත්ත ශාඛාවෙන් ලබා ගෙන ඇති බැංකු අයිරා පහසුකම වෙනුවෙන් ඇපයට තබා ඇති මෙම ස්ථාවර තැන්පතුව වර්ගීකරණය කිරීමේදී දිගුකාලීන ස්ථාවර තැන්පතු ලෙස වර්ගීකරණය වී ඇති අතර එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත . | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

[

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වෙනුවෙන් රු.3,232,563 ක 2023 ජනවාරි 20 වන දින ගෙවීම් සිදු කර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු බදු වගකීම ලෙස රු.203,802 ක වටිනාකමක් පමණක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.සමාලෝචිත වර්ෂයේ දී දෙසැම්බර් මාසයට අදාල ගෙවිය යුතු රු.3,232,563 ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු ගෙවීම් යටතේ රු.7,533,246 ක වටිනාකම තුල ඇතුලත් කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වෙනුවෙන් ගෙවන ලද රු 3,232,563 .ක වටිනාකම අයිටීඑන් , වීටීවී ,ලක්හඬ හා වීඑෆ්එම් නාලිකා හතර සඳහා ගෙවන ලද වටිනාකම වෙ.අයිටීඑන් එකට පමණක් අදාළ වටිනාකම රු 82/2,761,767.පමණක් අයිටීඑන් වියදම් වශයෙන් ගිණුම් ගත කර ඇති අතර එය ගෙවිය යුතු වියදම් වශයෙන් වර්ෂ අවසානයේ දක්වා ඇත . එය නිවැරදිව ගිණුම්ගත කර ඇති බව දන්වමි . | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිවැරදි මුදල් ප්‍රවාහයන් දැක්විය යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි වර්තමාන හා අතීත සේවා පිරිවැය සහ පොලී වියදමෙහි එකතු වටිනාකම රු.33,516,058 ක් ශුද්ධ ලාභයට හඳුනා ගෙන තිබුණු අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී බදු පෙර ශුද්ධ ලාභයට එම වටිනාකම පමණක් ගැලපිය යුතු වුවත් එම වටිනාකම සහ රු.8,216,716 ක ආයුගණක අලාභය ද | සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි වර්තමාන හා අතීත සේවා පිරිවැය සහ පොලී වියදමෙහි එකතු වටිනාකම. රු.33,516,058 සහ රු 8,216,716.ආයුගණක අලාභයද ,ශුද්ධ ලාභය ගණනය කිරීමේදී හඳුනාගෙන ඇත .එම නිසා මෙම රු 33,516,058 .ක අගය සහ රු 8,216,716 .ක අගයද මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී ගැලපිය | මුදල් ප්‍රවාහයන් නිවැරදිව ප්‍රකාශනයේ දැක්විය යුතුය. |

| | |
|---|---|
| ඇතුළත් කර එකතුව රු.41,732,774 ක් ගලපා තිබුණි. | යුතුව ඇත .එම නිසා මෙම අගයන් දෙකෙහි එකතුව රු41,732,774 . මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපීම නිවැරදි වන අතර පෙර වර්ෂ වලදීද මෙලෙස ගැලපීම සිදු කර ඇත. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු එකතු කල අගය මත බදු ශේෂය | 22,550,731 | 17,390,493 | 5,160,238 | 2022 දෙසැම්බර් මසට අදාළ ගුවන් කාල වටිනාකම එකතු කල අගය මත බදු (VAT) ගෙවනු ලබන්නේ 2023 ජනවාරි මස 20 වන දිනට පෙරය.නමුත් 2022වර්ෂයට අදාළ ගැලපීම්(Debit/Credit Notes) කරනු ලබන්නේ 2023 මුල් කාර්තුව තුලය. එවිට 2022 වර්ෂ අවසාන ගිණුම් පිළියෙල කිරීම සඳහා දත්ත ලබා ගනුයේ සියලු අදාළ ගැලපීම් වලින් පසු ලෙජරයේ ලබා ගන්නා දත්ත මතය. ඒ අනුව ගෙවිය යුතු හා ගෙවා ඇති ශේෂයන් අතර වෙනසක් ඇති වේ. එම වෙනසට අදාළ ගැලපීම් 2023 වසරේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.<br>ඒ අනුව බදු වැඩියෙන් හෝ අඩුවෙන් ගෙවීමක් සිදු නොවන අතර සෑම වර්ෂයක් සඳහාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බදු විගණනයක් සිදු කරනු ලබන අතර ,ඒ අනුව නිවැරදි අගයට බදු ගෙවීම සිදු වන බව දන්වමි . | නිවැරදි ශේෂය දැක්විය යුතුය. |

### 1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාධ්‍ය ජාලයේ ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ රු. 3,198,499,721 ක් වූ අතර 2022 වර්ෂයේදී රු.654,161,058 දක්වා අඛණ්ඩව අඩු වී තිබුණි. මාධ්‍ය ජාලය 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු. 107,189,266 ක් සිට රු. 361,564,271 ක් දක්වා අඛණ්ඩව අලාභ ලබා තිබුණි. සමාලෝචිත වර්ෂයේ ස්වාධීන රූපවාහිනී සේවයේ අලාභය රු.284,814,228 ක් වූ අතර ඒ යටතේ පවතින වසන්තම් ටීවී, අයිටීඑන් එෆ්එම්, වසන්තම් එෆ්එම් හි අලාභයන් පිළිවෙලින් රු.27,059,771, රු.44,592,216ක් සහ රු.5,098,056 ක් විය. | අදහස් දක්වා නොමැත | ආදායම් වර්ධනය කරගැනීමට කටයුතු කල යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණයගැතියන් 22 දෙදෙනෙකුගෙන් සමන්විත ප්‍රතිවෙළඳ ණය ගැති ශේෂ එකතු වටිනාකම රු.28,824,030 ක් වූ අතර මාධ්‍ය ජාලය විසින් අදාල සේවාවන් සපයා නොගැනීම හේතුවෙන් වර්ෂ 05 ඉක්මවා ඇති ප්‍රතිවෙළඳ ණය ගැති ශේෂයන්ගේ එකතුව රු.17,288,168 ක් වී තිබුණි.මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.14,641,728 ක් එනම් මුළු ප්‍රතිවෙළඳ ණයගැති ශේෂයෙන් සියයට 51 ක හානිකරණ ගැලපීම් සිදු කර තිබුණි. | ප්‍රති වෙළඳ ගනුදෙනු වලට අදාළ සේවය ලබා ගැනීම තහවුරු කෙරෙන ඉන්වොයිස් පත් හා ලිපි ලේඛන නියමිත පරිදි නොලැබීම හේතුවෙන් මෙම ශේෂය කලක් තිස්සේ පොත් වල පෙන්නුම් කර ඇත. ඉදිරියේදී අදාළ චක්‍රලේඛ අනුව දීර්ඝ කාලයක් පවතින ප්‍රතිගනුදෙනු ශේෂයන් කපා හැරීමට කටයුතු කරනු ඇත . | ණය ගැති ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |
| (ආ) | ස්වාධීන රූපවාහිනී සේවයේ සේවාදායක ණයගැති ශේෂය තුල ඇතුලත් වසර 05 ට වඩා වැඩි ණය ගැති ශේෂය රු.182,444,875 ක් වූ අතර වෙළඳ ණයගැති ශේෂය තුල ඇතුලත් රු. 108,928,257 ක් මිලියන 5ට වැඩි වටිනාකම් සහිත රාජ්‍ය ආයතන 06 කින් නියෝජනය වී තිබුණි. එසේම රාජ්‍ය ආයතන 14 ක් ඇතුළුව ණයගැතියන් 47 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණු වසර 5 ඉක්මවූ රු.මිලියනයට වැඩි ණයගැති ශේෂ එකතු වටිනාකම රු.113,797,981 ක් වූ අතර ඉන් රු. 112,439,341 ක් නියෝජනය වූ ණයගැතියන් 46 දෙනෙකු වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉහත රාජ්‍ය ආයතන ඇතුළුව ලබා ගත හැකි ශේෂයන් අතරින් ලබා ගැනීමට හැකි සියලු මුදල් ලබා ගැනීමට කටයුතු කරන ලදී. නොගෙවූ ශේෂයන් කොටසක් ලිපි ලේඛන හුවමාරු නොවීම මත ඇති වී ඇත. එමෙන්ම ප්‍රධාන ඒජන්සි ආයතන වලින් ලැබිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් අය කර ගත් පසු අප වෙත ගෙවන බව දන්වා ඇති ඒවාද වේ. තවද රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු ශේෂයන් ද ඒ අතර අන්තර්ගත වේ .රාජ්‍ය ආයතන කිහිපයක් සම්බන්ධයෙන් පවතින ශේෂයන් අය කර ගැනීමට මේ වන විටත් අදාල ආයතන සමග කටයුතු කරමින් සිටී.මේ වන විට ඉහත ශේෂයන්ගෙන් රු.මි.6.5 ක් පමණ | ණය ගැති ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | සදහා නීති කටයුතු අවසන් කර ඇත . තවත් රු.මි.26 ක් පමණ ප්‍රමාණයකට නීති ක්‍රියාමාර්ග ගැනීමට නීති අංශයට යොමු කර ඇතත් පවතින යම් යම් නීති ගැටළු මත ඒවා නිරාකරණය කර ගනිමින් අදාල කටයුතු කරමින් සිටියි.<br>ලිපි ලේඛන නිසි පරිදි සම්පූර්ණ වී ඇති ප්‍රධාන ගනුදෙනුකරුවන් නොවන අය සදහා නීති කටයුතු කරන අතර ප්‍රධාන ඒජන්සි වලින් ලැබිය යුතු ශේෂයන් සදහා නීති කටයුතු කිරීමට අපහසු වී ඇත්තේ ඔවුන් විසින් නිරන්තරයෙන් ආයතනය වෙත දැන්වීම් ලබා දෙමින් සිටින බැවින්ය ආයතනයේ ආදායමෙන් 80% පමණ ලැබෙන්නේ ඉහත ප්‍රධාන ඒජන්සි ආයතන වලින්ය .වසර 5 කට වැඩි කාලසීමාවේදී ආයතනය විසින් කර ඇති සමස්ත ණය ගනුදෙනු ප්‍රමාණය රු.මි .21,200 ක් පමණ වේ.<br>ආයතනය විසින් මෙම කාලය තුල ඉන් 99.1% පමණ අය කර ගෙන ඇති අතර ඉහත විස්තර කල පරිදි විවිධ හේතු මත 0.9% පමණ ප්‍රතිශතයක් ශේෂ වී ඇත.<br>අය කර ගැනීමට හැකි මුදල් තව දුරටත් අය කර ගැනීමට කටයුතු කරනු ලබන අතර ,වර්තමානයේදී ආයතනය විසින් ණය ප්‍රතිපත්තියක් හදුන්වා දී එය ක්‍රියාත්මක කරන අතර ඒ අනුව නිසි පරිදි ලිපිලේඛන ලබා ගැනීම,නිසි ලෙස අධීක්‍ෂණය කරමින් දැන්වීම් ලබා ගැනීම, අදාල ගැටළු ඉක්මනින් නිරවුල් කිරීම වැනි ක්‍රම අනුගමනය කරන අතර පසුගිය වසර 2 තුල රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු ශේෂයන් ඉතා අල්ප වී ඇත .ඒවාද ලබා ගැනීමට කටයුතු කරමින් පවතී | |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.69,702,230 ක් වූ විලම්බිත ආදායම් ශේෂය තුළ වසර 05 ට අඩු ශේෂය රු.19,472,000 ක් ද, වසර 05 ත් 10 ත් අතර ශේෂය රු. 15,869,506 ක් ද, වසර 10 ට වැඩි ශේෂය රු. 34,360,725 ක් ද ඇතුළත්ව තිබුණු අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය ලබා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ගිණුම් වලින් ඉවත් කර නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | දිගු කාලයක් තුල ඉදිරියට ගෙන එමින් පවතින ශේෂ නිරවුල් කිරීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 9,758,581 ක් වූ අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය තුළ වසර ඉක්ම වූ චෙක්පත් 672 ක වටිනාකම රු.7,037,394 ක් වූ අතර මෙම ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | වර්ෂ 3 ක් ඉක්මවූ අවලංගු කල චෙක්පත්වල වටිනාකම් 2023 අවසන් ගිණුම් වලින් ගැලපීමට කටයුතු කරනු ලැබේ. | අවලංගු කළ චෙක්පත් ශේෂ නිරවුල් කිරීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 02 ජේදය | නිලවාහන හිමිකම් නොමැති මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 41 දෙනෙකු සඳහා ප්‍රවාහන දීමනා වශයෙන් රු.6,524,899 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවා තිබුණි. | පොදු ප්‍රවාහන පහසුකම් අවම වීමද සලකා මෙම දීමනාව ආයතනික ව්‍යවස්ථාවට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීමට කටයුතු කර ඇත . | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ)(i) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (i)සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) වගන්තිය | එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවද කාර්යය මණ්ඩලය සඳහා ලබාදෙන්නා වූ අත්තිකාරම් හා මිලදී ගැනීම් සඳහා බාහිර පුද්ගලයන් වෙත ගෙවන අත්තිකාරම් මුදල් ගෙවූ අවස්ථා 77 කදී සීමාව ඉක්මවා රු.22,790,397 ක වටිනාකමක් සඳහා අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | ආයතනයේ ගනුදෙනු ස්වභාවය අනුව දෙනු ලබන අත්තිකාරම් වල සීමාව මුදල් රෙගුලාසි වලට අමතරව කමිටුවක් මගින් දෙන ලද තීරණයක් අනුවද ,මුල්‍ය අධිකාරී අනුමැතියට (Delegation of Financial Authority) යටත්වද,ආයතනයේ පුද්ගලයන්ට මෙන්ම බාහිර පාර්ශවයන්ටද අත්තිකාරම් මුදල් ලබාදේ. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල සීමාවන් තුල ඉහල කළමනාකාරීත්වයේ අනුමැතියට යටත්ව අත්තිකාරම් ලබා දෙනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (i)සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371 (5)වගන්ති | අදාළ කාර්ය නිමකර දින 10ක් ඇතුළත ලබාගත් අතුරු අග්‍රිමය පියවියයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට මාස 03 ඉක්මවූ කාර්යමණ්ඩලය සඳහා ලබාදෙන අත්තිකාරම් හා බාහිර පුද්ගලයන් සඳහා ලබාදෙන අත්තිකාරම් මුදල් ශේෂය රු.7,614,016ක් විය. | මාසයකට ආසන්න කාලයක් සඳහා වැඩසටහන් නිෂ්පාදනය සඳහා කොළඹින් පිට රැඳී සිට නැවත ආයතනයට පැමිණීමෙන් පසු අත්තිකාරම් පියවීමට ගත වන කාලය වෙනස් විය හැක .ඒ ඒ වැඩසටහන් වල ස්වභාවය අනුව එම කාලය තීරණය වේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව එය සිදු කරන ලදී.<br>අදාළ දිනයන්හි නොපියවන අත්තිකාරම් ලබාගත් අය සඳහා අවවාදාත්මක ලිපි නිකුත් කරන අතර ,පැමිණීමේ දිරි දීමනාව අත්හිටුවීමට ක්‍රියා කරනු ලබයි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) 2017 වරලත් ගණකාධිකරණ ආයතනයේ මනා පාලනය පිළිබඳ සංග්‍රහයේ A.2.1 ඡේදය | 2022 සැප්තැම්බර් 22 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පත්‍රිකා 363/09 අනුව සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර අහෝසි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු අතර සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුරු දෙකෙහිම බලතල සහ වගකීම් ඉටුකිරීම පිළිබඳ සාධාරණීකරණය කරමින් වාර්ෂික වාර්තාවෙහි කරුණු ඉස්මතු කර දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ වාර්ෂික වාර්තාවෙහි මෙම කරුණ පිළිබඳව කිසිදු සටහනක් ඉදිරිපත් තර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව අනුමත සේවක සංඛ්‍යා ව්‍යුහයෙන් ප්‍රධාන විධායක නිලධාරී තනතුර අහෝසි කිරීමට අනුමැතිය ලබාදෙන ලෙස ලේකම් ,ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2022.10.25දින ලිපියක් යොමු කර ඇති අතර මේ දක්වා ඒ සම්බන්ධයෙන් පිළිතුරක් අප වෙත ලබාදී නොමැත.<br>ඒ අනුව ප්‍රධාන විධායක නිලධාරී තනතුර අහෝසි කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාදීමෙන් පසු ප්‍රධාන විධායක නිලධාරී තනතුරේ බලතල හා වගකීම් සභාපති හා සාමාන්‍යාධිකාරී වෙත සුදුසු පරිදි පැවරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර එම අනුමැතිය මත ඒ සම්බන්ධයෙන් වාර්ෂික වාර්තාවේ කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත . | වාර්ෂික වාර්තාවෙහි කරුණු ඉදිරිපත් කල යුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාධ්‍ය ජාලයේ පවත්වා ගෙන යන බැංකු ජංගම ගිණුමකට අදාලව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට බැංකු අයිරාව රු.92,763,071 ක් වූ අතර මෙම බැංකු අයිරාව සඳහා පොලී ලෙස රු. 9,399,978 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | 2022වර්ෂයේ විශාල වශයෙන් ආර්ථික අර්බුදය බලපෑම හේතුවෙන් බැංකු අයිරා පහසුකම යොදා ගැනීමට සිදුවූ අතර ඉදිරියේදී එය අඩු කර ගැනීමට කටයුතු කරනු ඇත. | වියදම් අවම වන අන්දමින් කටයුතු කල යුතුය. |
| (ආ)මාධ්‍ය ජාලයේ 2020 වර්ෂයේ රු. 620,761,280 ක් වූ කාරක ප්‍රාග්ධනය 2021 වර්ෂයේ දී රු.399,833,265 ක් දක්වා අඩු වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී එය රු.117,049,242 දක්වා අඩු වී තිබුණි. | අදහස් දක්වා නොමැත | ආදායම් වර්ධනය කරගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.361,564,271 අලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු. 315,974,401 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි ඉකුත් වර්ෂයේ අලාභය රු.45,589,870 කින් ඉහළයාමක් නිරීක්ෂණය විය. මෙම අලාභය ඉහලයාමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල ගුවන් කාල ආදායම අඩුවීම සහ වැඩසටහන් වියදම් සහ අලෙවි වියදම් ඉහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2021 වර්ෂයේ දී රු.1,407,648,212 ක් වු ගුවන් කාල විකුණුම් ආදායම සමාලෝචිත වර්ෂයේ රු.1,394,668,739 ක් වු අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 1 ක අඩුවීමකි.ශුද්ධ මූල්‍ය ආදායම සමාලෝචිත වර්ෂයේ දී රු.54,907,485 ක් වු අතර 2021 වර්ෂයේ දී රු.30,410,661 ක් එනම් සියයට 45 ක වැඩිවීමකි.එමෙන්ම 2021 වර්ෂයේ දී රු.579,015,447 ක් වු වැඩසටහන් වියදම් සමාලෝචිත වර්ෂයේ දී රු.503,971,809 ක්ව තිබු අතර එනම් සියයට 15 කින් වැඩසටහන් වියදම් වැඩි වී තිබුණි.සමාලෝචිත වර්ෂය තුල අලෙවි වියදම් රු.97,326,223 ක් වු අතර ඉකුත් වර්ෂයේ රු.87,284,911 ක් වු අලෙවි වියදම් සියයට 11 කින් වැඩි වී තිබුණි.2021 වර්ෂයේ වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් රු.1,300,923,871 ක් වු අතර සමාලෝචිත වර්ෂයේ දී රු.1,282,361,160 ක් එනම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට1කඅඩුවීමකි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ දී මාධ්‍ය ජාලයේ ද්‍රවශීලතා අනුපාත සහ ලාභදායීත්ව අනුපාත ඉකුත් වර්ෂයට සාපේක්ෂව අයහපත් ලෙස විචලනය වී ඇති බව නිරීක්ෂණය විය.

| | 2022 | 2021 |
|---|---|---|
| ජංගම අනුපාතය | 1.10 | 1.44 |
| ක්ෂණික අනුපාතය | 1.07 | 1.43 |
| ශුද්ධ ලාභ අනුපාතය | -26% | -23% |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය | -54% | -32% |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාධ්‍ය ජාලයට එරෙහිව අපහාස වන්දි නඩු 03 ක් පවරා තිබුණු අතර ඒ සඳහා ඉල්ලුම් කරන ලද වන්දි මුදල රු. 105,000,000 ක් විය. ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය මගින් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම ,බෙදා හැරීම හෝ විකිනීමට ඇති අයිතිවාසිකම සමාගම විසින් කඩ කිරීමට එරෙහිව නඩු 06 ක් සහ සමාගමට එරෙහිව චිත්‍රපට බුද්ධිමය දේපල නඩු 06 ක් පවරා තිබුණු අතර එම නඩු සඳහා ඉල්ලා ඇති වන්දි මුදල පිළිවෙලින් රු.490,000,000 ක් සහ රු. 20,325,000 ක් විය. වෙනත් කරුණු සඳහා නඩු 04 ක් ද සමාගමට එරෙහිව පවරා තිබුණු අතර ඒ සඳහා වන්දි මුදල රු.12,000,000 කි. මෙම නඩු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී රු. 1,350,052 ක වියදමක් දරා තිබුණි. | ආයතනයේ ප්‍රචාරය වූ ප්‍රවෘත්ති සම්බන්ධයෙන් නඩු 02ක් සහ ආයතනය විසින් විකාශය කල චිත්‍රපට සඳහා බාහිර තෙවන පාර්ශවයක් විසින් විකාශන අයිතිය සම්බන්ධයෙන් නඩු ගොනු කර ඇති අතර මෙම නඩු ද සමත කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි . කෙසේ වෙතත් අප විසින් චිත්‍රපට සැපයුම්කරුවන් සමග ඇතුලත් වී ඇති ගිවිසුම අනුව තෙවන පාර්ශවයක් විසින් ආයතනයට විරුද්ධව නඩු පවරන අවස්ථාවකදී ආයතනයට සිදු වන්නා වූ සියලුම අලාභ නඩු ගාස්තු ද ඇතුලත් ව ආයතනයට වන්දි (Indemnity) ලෙස ගෙවීමට අදාල සැපයුම්කරුවන් බැදී සිටි . | වියදම් අවම වන අන්දමින් කටයුතු කල යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ අලෙවි විධායක නිලධාරීන් 28 දෙනෙකු සේවා නියුක්තව සිටි අතර ඉන් ස්වාධීන රූපවාහිනී නාලිකාවේ නිලධාරින් 12 දෙනෙක් බොහෝ මාස වලදී ඔවුන් වෙත මාසිකව ලබා දෙනු ලබන අලෙවි ඉලක්ක වලින් සියයට 50 ක් හෝ ළඟා කරගෙන නොතිබුණි. ලක්හඬ රේඩියෝ නාලිකාවේ එක් නිලධාරිනියක් වර්ෂය පුරාම අලෙවි ඉලක්ක වලින් සියයට20 ක් හෝ ළඟා කරගෙන නොතිබුණු අතර අනෙකුත් නිලධාරීන්ද ඇතැම් මාස වලදී සිය අලෙවි ඉලක්ක වලින් සියයට 50 ක් හෝ ළඟා කරගෙන නොතිබුණි. | අප රටෙහි පැවැති විදුලි කප්පාදුව ,අරගල සහ අනෙකුත් ආර්ථික පරිහානිය, ආර්ථික අර්බුදය හේතුවෙන් වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය ,සේවාදායකයින් විසින් නවතාදැමීම නිසා මෙම අලෙවි ඉළක්ක සපුරා ගැනීමට නොහැකි විය .කෙසේ වෙතත් 2023වසරේ සිට අලෙවි විධායකයින්ගේ කොන්ත්‍රාත් ගිවිසුම් අළුත් කිරීමේදී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඔවුන්ගේ කාර්ය සාධනය සලකා කොන්ත්‍රාත් ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කරන අතර ඔවුන්ගේ දූර්වලතා හඳුනා ගෙන එම දූර්වලතා වලක්වා ගන්න ලෙස ලිඛිතව දැනුම් දෙනු ලැබේ .තම අලෙවි ඉලක්ක දිගින් දිගටම සපුරා නොගන්නා අලෙවි අලෙවි විධායකයින්ගේ කොන්ත්‍රාත් පත්වීම් අවලංගු කිරීමට ඉදිරියේදී සලකා බලනු ඇත. | අලෙවි ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාධ්‍ය ජාලය විසින් 2015 වර්ෂයේ මිලදීගත් රු. 1,588,500 ක් වූ Hot Swappable Power Distribution Rack යන්ත්‍රයක් මිලදී ගත් දින සිට සහ 2010 වර්ෂයේ මිලදී ගන්නා ලද පිරිවැය රු. 1,218,274 ක් වූ Aros Flexus FT- 30 ,30KVA UPS System යන්ත්‍රය වසර 04 ක පමණ කාලයක සිට භාවිතයකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | Hot Swappable Power Distribution Rack යන්ත්‍රයක් සවි කරනු ලැබුවද ඊට අදාළ අනෙකුත් උපකරණ රජයේ ආනයන සීමා කිරීමේ ප්‍රතිපත්තිය හා ආයතනය තුල පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් එය ක්‍රියාත්මක මටටමට පත් කිරීමට නොහැකි වී ඇත.<br>30 KVA UPS System අකුණු සැර මත අක්‍රිය වී ඇති අතර රක්ෂණ වන්දිය ලබා ගැනීම සඳහා අවුරුදු 1½ කට වැඩි කාලයක් ගතවෙන ලදී .ඉන්පසු ආනයන සීමා කිරීමේ හේතුවෙන් තව අවුරුද්දක් පමණ කාලයක් ගතවූ අතර වර්තමානයේදී ඩොලර් වල පවතින අර්බුදකාරී තත්වය හේතුවෙන් මීට අදාළ අමතර උපකරණ ලබා ගැනීමට නොහැකි තත්වයක් උද්ගතව පවතී . | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාධ්‍ය ජාලයේ ආරක්ෂාව සැපයීම වෙනුවෙන් සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම 2015 ජනවාරි 31 දිනෙන් අවසන් වී තිබුණු අතර ඉන් පසුව සමාලෝචිත වර්ෂය දක්වාම ගිවිසුම අලුත් කර ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මගින් පමණක් අනුමැතිය ලබාගෙන මාධ්‍ය ජාලය සේවය සපයාගෙන තිබුණි. | සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම ආරක්ෂක සේවය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් ගිවිසුම අලුත් කර ගැනීමක් සිදු නොවී ඇති අතර, 2023 වර්ෂයේදී ගිවිසුම අලුත් කර ගැනීමට කටයුතු කරනු ඇත. | සේවා සපයා ගැනීම සඳහා විධිමත් අන්දමින් ගිවිසුම් වලට එළඹිය යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාධ්‍ය ජාලය සමාලෝචිත වර්ෂය තුළ දී කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 04ක් ද, දෛනික පදනමින් සේවකයින් 02 දෙනෙක් ද බඳවා ගෙන තිබුණු අතර අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 49 දෙනෙකු සේවයේ නියුක්ත කර තිබුණි.අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ නිලධාරීන්ට පෞද්ගලික වන සේ ස්ථිර සේවකයන් 102 ක්ද දෛනික පදනම මත සේවකයින් 02 ක්ද, අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත් පුරප්පාඩු වූ ස්ථිර තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් සේවකයන් 66 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට සේවයේ නියුක්ත කර තිබුණි. | විගණක අධිකාරිගේ 2023.01.03 දිනැති ලිපියේ ඉදිරිපත් කර ඇති ආකෘතිය අනුව සේවක සංඛ්‍යා විස්තර ලබාදී ඇති බව දන්වමි. | ස්ථිර තනතුරු වල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |
| (ආ)ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 3.3 ඡේදය අනුව, අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩුවක් ස්ථිර පදනම මත පුරවන තෙක්,ඒ සඳහා අනියම් පදනම මත නිලධාරියෙකු බඳවා ගැනීමෙන් වැළකිය යුතු වුවත් මාධ්‍ය ජාලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අනියම් පදනමින් සේවකයන් 33 දෙනෙකු බඳවාගෙන තිබුණි. | සේවා අවශ්‍යතාවය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යා ව්‍යුහය තුල හා බඳවාගැනීම් පරිපාටි පදනම් කරගෙන සේවා අත්‍යවශ්‍යතාවය මත මෙම සේවකයින්ගේ සේවය ලබාගෙන ඇත. | ස්ථිර තනතුරු වල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |